# The world's first pregnant man

## just two weeks from the birth of his baby girl.

## පිරිමියෙකු ගැබ්ගත් ලොව ප්‍රථම අවස්ථාව

### තව දෙසතියකින් දරු ප්‍රසූතියට සූදානම් වන මිනිසාගේ කතාන්තරය

**By Georgina Dickinson**
**News of the World**

In an exclusive and moving interview with the News of the World, sex-change dad **Thomas Beatie** and his wife **Nancy** tell of their joy. And he reveals unseen family snaps of his astonishing early life as a teenage beauty queen.

In a tender and intimate moment, Thomas shares a cuddle with wife Nancy- before telling the News of the World of his secret hopes for the future.

With four weeks to go, he sensationally reveals the couple are ready to have MORE BABIES after the birth of their daughter.

And as well as posing for these amazing world exclusive pictures, Thomas opens up his family album to show unseen snaps of his life as a teenage beauty queen.

Thomas-who changed sex ten years ago but kept his ovaries and womb so he could have children-told us: “ I feel on top of the world.

“ I'm 36 weeks now and almost due but I feel fantastic. Every day Nancy and I think about how we just cannot wait to hold our daughter for the first time, to finally get to touch her and see her face.

“ We have her nursery ready and her diapers are lined up in her bedroom. Everything is ready to go.


“ We have even picked a name which we both love- although we're waiting until she is born before we tell anyone. All the people who really know us and love us, our friends and family, have been incredibly supportive.

“ So much so we might even have more children. We will just see what the experience is like with our daughter's arrival first and then give it some thought.”

Photos from his past document his transformation from a Hawaiian beauty called **Tracy Lagondino** into the man he is today. Brave Thomas has caused worldwide controversy over the "reverse" pregnancy, which was the only way he and Nancy could have children.



**Thomas with his wife Nancy feeling the tummy bulge**



Thomas had his breasts removed ten years ago but chose to keep his female reproductive organs because Nancy, 45, had undergone a hysterectomy.

When the time came, he had to stop taking his sex-change testosterone hormone so he could start ovulating again.

He fell pregnant with twins on his first attempt using donor sperm bought from a cryogenic sperm bank.

Past pictures show just how beautiful Thomas was as Tracy from her early school years to her teens.

Tracy and her two brothers were raised in Hawaii by their father after their mother committed suicide.


The young beauty was a model- even making it to the finals of Miss Hawaii Teen USA.





**Courtesy- News of the World - Photos- Getty Images**

**තෝ**මස් බීටි හා ඔහුගේ බිරිඳ වන නැන්සි ඇමරිකාවේ ඔරිගන් හි වෙසෙන විවාහක යුවලකි. එය එක් අතකට තරමක අස්වාභාවික ලෙස කෙනෙකුට පෙනෙනු ඇත. තෝමස් අද පූර්ණ පිරිමියෙකු ලෙස ජීවත්වන නමුත් ඔහු මෙලොවට බිහිවුනේ ගැහැණු ළමයෙකු ලෙසිනි. නම ට්‍රේසි වීය. ට්‍රේසි සැබැවින්ම ඉතා සුරූපී තරුණියක වූවා ය. ඇය වරක් ඇමරිකානු බාලවයස්කාර රූ රැජිණ ලෙසද තේරුණාය. දැනට වසර කීපයකට පෙර ඇය සිය ලිංගික භාවය වෙනස් කළාය. එනම් ශල්‍යකර්මයකින් පිරිමි යෙකු වූවාය. ට්‍රේසි, තෝමස් වූයේ ඒඅයුරිනි. තෝමස්ට නිවාඩු නිකේතනයකදී නැන්සි නම් කාන්තාව හමුවිය. ඔව්හු පෙමින් බැඳී දැනට වසර හයකට පෙර විවාහ වූහ. එහෙත් නැන්සිටද කලින් කරන ලද ශල්‍යකර්මයක් නිසා දරුවන් පිළිසිඳ ගැන්මේ බාධාවක් තිබිණ. දෙදෙන දැඩි ආශාවෙන් දරුවෙකු බලාපොරොත්තු වූහ. කළ යුතු එකම දෙය ලෙස තෝමස් තීරණය කළේ ගැහැණියකව සිට පිරිමි යෙකු වූ තමා නැවත ගැහැනියක වී දරුවෙකු බිහිකළ යුතු බවය. වාසනාවට පිරිමි යෙකු වන ශල්‍යකර්මයේ දී එදා ඔහුගේ සිරුරේ ගර්භාෂය හා ඩිම්බකෝෂ ඉවත් කර නොතිබිණ. බිරිඳ නැන්සිද කැමති වූවාය. කෘතිම අන්දමින් තෝමස්ගේ සිරුර තුළට ශුක්‍රාණු යැවීමෙන් ගැබ්ගැනීම සිදුවිය. සියල්ල යහපත් අන්දමින් අවසන් වී මට නියමිත ය. වෛද්‍ය පරීක්ෂණ වලින් තමනට ලැබෙන්නේ ගැහැණු දරුවෙකු බව ද ඔව්හු දනිති. දරුවාට නමක් ද දැනටම තෝරා ඇත. මේ දරුවාට පසු තවත් දරුවන් කීපදෙනකුම බිහිකිරීම තෝමස්ගේ අදහසයි. නැන්සි ද ඊට එකඟ වන්නීය. ‘එතකොට අපි ලොකු පවුලක්’ ඔව්හු කියති. මෙවැනි දෙයක් ලොව සිදුවූ ප්‍රථම අවස්ථාවයි මේ. තව කොපමණ පුදුම දේ අපට අසන්නට වේද?



**This is Tracy, the stunning teenage girl, before the sex change to become the man known as Thomas**
***තෝමස් නම් පිරිමියා වන්නට පෙර ට්‍රේසි නම් සුරූපී තරුණිය ලෙස වසර කීපයකට පෙර හවායි දූපතේදී***



## ගොවියාවේ රටක බලේ.......
## අපේ ලංකාවේ උතුරාවි දැන් කිරී



**මේ** ලිපියේ මාතෘකාවට උඩ යොදලා තියෙන්නේ හුඟක් පැරණි චිත්‍රපට සිංදුවක මුල් පද දෙක.

1958 ලංකාවේ ප්‍රදර්ශනය වුණු ඩිංගිරි මැණිකා කියන සිංහළ චිත්‍ර පටයෙ ගීතයක් ඒ. ගීතයෙ පද රචනා මෑතකදි නැසීගිය කරුණාරත්න අබේසේකරයන්ගෙ. අද අප අතර නැති ධර්මදාස වල්පොල ගායකයාණන් ඒ ගීය ඉතා ලයාන්විතව ගායනාකළා.

“ගොවියාවේ රටක බලේ....ගොවියවේ.... අපේ ලංකාවේ උතු රාවි දැන් කිරී.... කෙතේ හා සාරයි සිරී.... සාර ගොයම් දිලේ දිලේ යාය ගොයම් පැසීලා.... ගොවියාවේ රටක බලේ.... ටං ටං.....”

දැන් ඉන්න තරුණ පෙළ දන්නෙ නෑ. ඒ පණස් ගණන්වල අපි පුංචි කාලෙ ලංකාවෙ ගොවිතැන හරි දියුණු තත්වෙක තිබුණෙ. ඒ යුගයේ ලංකාව පුරාම සශ්‍රීක වෙල් යායවල් තිබුණා. බස් එකකින් හෝ පයින් හෝ ලංකාවෙ කොයි පළාතට ගියත් ඒ කාලෙ හිනාවෙන ගොයම් පැලපත්, කරලින් බරවුණු යායවල්, ගමේ පාරක ඒ යුගයෙ යනකොට ඉස්සරහට නිතර හම්බවෙන්නෙ අමුඩයක් ගහගෙන, උදැල්ල කරේතියාගෙන යන ගොවිරාළලා. ඉතින් ඉහතින් සඳහන් ගීතය නිකම් චිත්‍රපට කතාවකට මවාපාලා ලියපු සංදුවක් නෙවෙයි එදා ලංකාව පෙනුණු හැටි තමයි ඒ.

කෝ ඒවා දැන් ? කෝ ගොවියො? කෝ කුඹුරු? ඒවා සේරම පුරන් වෙලා. ඒ පරණ ගොවි පරම්පරාව ඉවරයි. පිට රටින් හාල් ගෙන්නන්න පටන් ගත්තයින් පස්සෙ ලංකාවට ගොවිතැන අමතක වුණා. කුඹුරුකරන්න හිටි ගමේ තරුණ පෙළ මැදපෙරදිග රස්සාවල් හොයං ගියා. දැන් කවුරුත් පිට රටට කට ඇරගෙන ඉන්නවා. අතීතයේ රජකාලෙ ගොවිතැනට රාජ්‍ය අනුග්‍රහය ලැබුණා. රජවරු ගොවිතැනට අවශ්‍ය වැව් අමුණු හදලා දුන්නා. නමුත් පස්සෙ පස්සෙ ලංකාවෙ සිංහළයා කුඹුරට බහින්න අකමැති තත්වයකට පත්වුණා. මඩ ගෑවෙනවට කැමතිවුණේ නෑ. සේරටම ඕන වුණේ ආණ්ඩුවෙ කායයීයාල ඇතුළෙ රස්සාවල් කරන්න.

පරණ දේශපාලකයන්ගෙන් සේනානායක මහත්තෙයා ප්‍රමුඛ පිරිසක් ඇත්තටම ගොවිතැන නගාසිටුවන තැනට වැඩ කළා. ගල්ඔය ජනපද ව්‍යාපාරය ඇති කළේත් ඒකට. ඒවගේම මිනිපේ ව්‍යාපාරය ඇති කළේත් ගොවිතැනේ දියුණුවට. පස්සෙ පස්සෙ ගොවිතැන ආණ්ඩුවලට අමතක වේගන ගියා. ගොවිතැන දියුණු කළේ කටින් විතරයි.

ජේ. ආර් ජයවර්ධන මහත්තෙයගෙ කාලෙ රජය ගොවිතැනට ආදරේ බව පෙන්නන්න වප්මගුල කියලා උත්සවයක් කළා. ජේ.ආර්. මැති ඇමතිවරු කීප දෙනෙක් එක්ක වෙල්යායකට බැහැලා, මීහරක් දෙන්නෙක් මඩවලා (හැබැයි ඒ කවුරුවත් අමුඩ නම් ගැහුවෙ නෑ) නියර උඩ තියන් හෝටලේ කින් ගෙන්නගත්තු ඇඹුලත් කාලා, පැයකින් දෙකකින් ගෙදරත් ගියා. එදා සමහර ඇමතිවරු වෙලට බැස්සෙ සන්ග්ලාස් දා ගෙන. ඒකටනම් කමක් නෑ. ඒ වප්මගුලෙ පින්තූර එදා පත්තර වල ගියා. එච්චර තමයි ගොවිතැන දියුණු කිරීම. ඊට පස්සෙ ආයිත් වප්මගුල් තිබ්බෙත් නෑ. ගොවිතැනගැන කතාකළෙත් නෑ. තාමත් පිටරටින්ම හාල් ගේනවා. ඒව නිකං සෝබන වැඩ.

විපක්ෂය කලකට ඉහත යෝජනා කළා ගොවියන්ට අමුඩෙ වෙනුවට ඩෙනිම් අන්දවලා, බුලත් විට වෙනුවට චුයිංගම් හපන්න දීලා, කකුල කැපෙනවට නයික් ට්‍රේනර්ස් දීලා, මොබයිල් පෝන්එක බැගින් දීලා කුඹුරට බස්සන්න. මොබයිල් එක කුඹුරෙ ඉඳලා හාමිනේට කතාකරලා වෙලාවට ඇඹුල ගේන්න කියන්නයි. ඒ වැඩේ නරක නෑ. විපක්ෂය ළඟ මරු අදහස් තියනවා. ළඟදි කරත්තවලින් කොළඹ වටේ ගිය එකටත් මම කැමතියි. විපක්ෂයකින් ඒ වගේ අළුත් අදහස් දෙන්න ඕන.

ජනාධිපතිතුමා ළඟදි ඔක්ස්පර්ඩ්වලදි කළ දේශනාවේදිත් කිව්වා, ලංකාවෙ කෘෂිකර්මය දියුණුකරන බව. දැන් උමා ඔය හරවන්නෙත් ඒකට. එතුමා ගොවියෙකුගෙ පුතෙක්. ඒ නිසා ඒ කියන වචන විස්වාස කරන්න පුළුවන් කියලා මම හිතනවා.

♦ වෙලේගෙදර රාළ London